දුරකථන/தொலைபேசி இல/Telephone Nos.

අමාත්‍ය / அமைச்சர் / Minister } 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary } 2784812

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50, Fax 2784846

ඊමේල් – மின்னஞ்சல்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. } ..............................

7

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, බත්තරමුල්ල
'இசுருபாய', ஸ்ரீ ஜயவர்த்தனபுர, பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura, Battaramulla

මගේ අංකය / எனது இல. / My No. } ED/7/99/ශා.පු/50

දිනය / திகதி / Date } 2012-09-[illegible]

## පාසල් ගොඩනැගිලි චක්‍රලේඛ අංක: 01/2012

සියලුම ජාතික පාසල්වල විදුහල්පතිවරුන් වෙත,

**දිවයිනේ ජාතික පාසලක ගොඩනැගිල්ලක් කඩා ඉවත් කිරීමට සිදු වන අවස්ථාවේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙල**

පාසලේ භාවිතයට ගත නොහැකි අබලන් ගොඩනැගිල්ලක් කඩා ඉවත් කිරීමේ දී හෝ නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ඉඩ ලබා ගැනීමට ගොඩනැගිල්ලක් හෝ එහි කොටසක් කඩා ඉවත් කිරීමේ දී පහත සඳහන් ක්‍රියා පිළිවෙල අනුගමනය කළ යුතු බව කාරුණිකව දන්වමි.

අ. මෙම චක්‍රලේඛයට යා කර ඇති "අබලන් ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම පිළිබඳ තත්ත්ව වාර්තාව" (ඇමුණුම 1) සම්පූර්ණ කර අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතුය. මෙහි දී ;
ඇමුණුම 1 වාර්තාවේ I කොටසේ සඳහන් තොරතුරු විදුහල්පති විසින් පළමුව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

ආ. විදුහල්පති ඉදිරිපත් කළ තොරතුරු කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පරීක්ෂා කර ඒ සම්බන්ධයෙන් ඇමුණුම 1 හි II කොටස සම්පූර්ණ කර ඔහුගේ නිර්දේශය ඉංජිනේරු වෙත ලබා දිය යුතුය.

ඇ. විදුහල්පති සහ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශ ද සැලකිල්ලට ගෙන අදාළ පරිදි ප්‍රදේශයේ පාසල් ගොඩනැගිලි ඉංජිනේරු හෝ දිස්ත්‍රික් ඉංජිනේරු (පාසල් ගොඩනැගිලි) හෝ ප්‍රාදේශීය ඉංජිනේරු විසින් ගොඩනැගිල්ලේ තත්ත්වය සම්බන්ධයෙන් ඇමුණුම 1 හි III කොටස සම්පූර්ණ කර ඔහුගේ නිර්දේශය පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය. ඉංජිනේරු විසින් ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම නිර්දේශ කරන්නේ නම් එයට ;

i. ඉංජිනේරුගේ තතත්ව වාර්තාව
ii. ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමට වැය වන මුදල ඇතුළත් ඇස්තමේන්තුව
iii. ගොඩනැගිලි ද්‍රව්‍ය වල තක්සේරුව
iv. පාසල් භූමියේ ගොඩනැගිල්ල දැක්වෙන දළ සැලැස්ම

යන තොරතුරු අනිවාර්යයෙන් ඇතුළත් කළ යුතුය.

ඈ. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ඉහත ආ, ඇ, ඈ නිර්දේශ ද සැලකිල්ලට ගෙන ඇමුණුම I සිට IV කොටස සම්පූර්ණ කර ඔහුගේ නිර්දේශය අධ්‍යාපන ලේකම් වෙත ලබා දිය යුතුය.

මේ අනුව මින් ඉදිරියට මා වෙත ඉදිරිපත් කරනු ලබන ගොඩනැගිලි කඩා ඉවත් කිරීමට අනුමැතිය ඉල්ලීම මෙම උපදෙස් අනුව ඉදිරිපත් කිරීමට පියවර ගන්නා ලෙස කාරුණිකව දන්වමි. එයට බැහැරව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සලකා බැලිය නොහැකි බව ද වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

**එස්.එම්.** ගෝඨාභය ජයරත්න
**ලේකම්**
අධ්‍යාපන අමාත්‍යාංශය

<u>පිටපත්:</u>

1. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) දකුණු පළාත/බස්නාහිර පළාත / සබරගමුව පළාත
2. අධ්‍යක්ෂ (ඉංජිනේරු සේවා) - වයඹ පළාත

   } කරුණාකර මේ අනුව ඔබ පළාතේ ඉංජිනේරුවන් දැනුවත් කරන්නේ නම් මැනවි.

3. පාසල් ගොඩනැගිලි අධ්‍යක්ෂ - උතුරු පළාත / නැගෙනහිර පළාත — කරුණාකර දැ.ගැ.පි. සහ අ.ක.ය.
4. සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු - — කරුණාකර මේ අනුව ඔබ පළාතේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් දැනුවත් කර අවශ්‍ය පියවර ගැනීම සඳහා
5. නියෝජ්‍ය අධ්‍යක්ෂ (පා.ගො.) - මධ්‍යම පළාත
6. ඉංජිනේරු (පා.ගො.) - උතුරු මැද පළාත
   ඌව පළාත

   } කරුණාකර දැ.ගැ.පි. සහ අ.ක.ය.

ඇමුණුම I

# අබලන් ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම පිළිබඳ තත්ත්ව වාර්තාව

මෙම වාර්තාවේ I කොටස විදුහල්පති විසින් ද, II කොටස කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ද, III කොටස අදාළ පරිදි ප්‍රදේශයේ පාසල් ගොඩනැගිලි ඉංජිනේරු හෝ දිස්ත්‍රික් ඉංජිනේරු (පාසල් ගොඩනැගිලි) හෝ ප්‍රාදේශීය ඉංජිනේරු විසින් ද, IV කොටස පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ද සම්පූර්ණ කර අධ්‍යාපන ලේකම් වෙත යොමු කළ යුතුයි.

## I කොටස: විදුහල්පතිගේ වාර්තාව

1. පාසල සහ එහි පිහිටීම :

1.1 පාසලේ නම

..............................................................................................................

1.2 අධ්‍යාපන කලාපය

....................................................................................................

1.3 අධ්‍යාපන කොට්ඨාසය

..............................................................................................

1.4 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

.................................................................................

1.5 මෙම වසරේ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව

................................................................................

2. කඩා ඉවත් කිරීම යෝජිත ගොඩනැගිල්ලේ තොරතුරු :

2.1 ගොඩනැගිල්ලේ ස්වභාවය

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

.....................................................................................................................................

2.2 ගොඩනැගිල්ලේ ප්‍රමාණය ; දිග ..............................................................

පළල ..............................................................

තට්ටු ගණන ..............................................................

2.3 අත්තිවාරමේ ස්වභාවය

.............................................................................................................................................

.............................................................................................................................................

2.4 බිත්තිවල තත්ත්වය හා බැඳ ඇත්තේ කුමන ද්‍රව්‍යයකින් ද යන වග

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

2.5 වහලයේ තත්ත්වය හා ඉදිකර ඇති ද්‍රව්‍ය පිළිබඳ විස්තරය

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

2.6 ගොඩනැගිල්ලේ ආයු කාලය (දළ වශයෙන් වර්ෂ)

.............................................................................................................................................

3. මෙම ගොඩනැගිල්ල කඩා දැමීමට හේතුව :

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

4. මෙම ගොඩනැගිල්ල කඩා දැමීමට හේතුව නව ගොඩනැගිල්ලක් ඉදිකිරීමට නම් ;

4.1 අදාළ නව ගොඩනැගිල්ල ඉදිකිරීම අනුමත කර තිබේද?

.............................................................................................................................................

4.2 එසේනම් එම ගොඩනැගිල්ලේ දිග, පළල සහ තට්ටු ගණන ....................................

.............................................................................................................................................

4.3 එම ගොඩනැගිල්ලේ වර්ගය (එනම් පන්ති කාමර ගොඩනැගිල්ලක්, විද්‍යාගාරයක් ආදී වශයෙන්)

.............................................................................................................................................

.............................................................................................................................................

4.4 එම ගොඩනැගිල්ල ඉදිකිරීමට ප්‍රතිපාදන ලබා දෙන ආයතනය / ව්‍යාපෘතිය

.............................................................................................................................................

.............................................................................................................................................

5. මෙම ගොඩනැගිල්ල කඩා දැමීම නිසා සිසුනගේ ඉගෙනීමට බාධා තිබේ ද?

එසේනම්, ඒ සඳහා විකල්ප මාර්ගයක් සකසා ගත හැකිවේ ද?

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

6. වෙනත් විස්තර

..................................................................................................................................

..................................................................................................................................

7. ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම සඳහා විදුහල්පතිගේ නිර්දේශය

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

............................ ..................................................

දිනය විදුහල්පතිගේ අත්සන (නිල මුද්‍රාව)

**<u>II කොටස: කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ නිර්දේශය</u>**

කඩා ඉවත් කිරීමට යෝජිත මෙම ගොඩනැගිල්ල පෞද්ගලිකව පරීක්ෂා කර බැලූ අතර විදුහල්පති විසින් ඉදිරිපත් කරන ලද ඉහත තොරතුරු නිවරදි බවට සහතික කරමි.

කඩා ඉවත් කිරීමට නිර්දේශ කරමි / නොකරමි.

නිර්දේශ නොකරන්නේ නම් ඊට හේතු :

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..............................................

............................ ..................................................

දිනය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ අත්සන (නිල මුද්‍රාව)

## <u>III කොටස: ප්‍රදේශයේ පාසල් ගොඩනැගිලි ඉංජිනේරු හෝ දිස්ත්‍රික් ඉංජිනේරු හෝ ප්‍රාදේශීය ඉංජිනේරුගේ නිර්දේශය</u>

1. විදුහල්පති සහ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂක ඉදිරිපත් කර ඇති ඉහත සඳහන් තොරතුරු මා විසින් පරීක්ෂා කර බැලුවෙමි. ඒ අනුව මෙම ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමට නිර්දේශ කරමි / නොකරමි.

2. ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමට නිර්දේශ කරන්නේ නම් පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කළ යුතුය.

2.1 තත්ත්ව වාර්තාව

2.2 ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමට යන වියදම රු. ........... (විස්තරය ඇතුළත් කරන්න)

2.3 ගොඩනැගිලි ද්‍රව්‍ය වල තක්සේරු වටිනාකම රු. .............. (විස්තරය ඇතුළත් කරන්න)

2.4 ඉහත 2.2 සහ 2.3 හි වෙනස රු. ..................................

2.5 පාසල් භූමියේ ගොඩනැගිල්ලේ පිහිටීම දැක්වෙන දළ සැලැස්ම

ඉහත සඳහන් ලියවිලි මේ සමග ඉදිරිපත් කරන අතර, මෙම ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම මා විසින් නිර්දේශ කරමි / නොකරමි.

නිර්දේශ නොකරන්නේ නම් එයට හේතු :

.........................................................................................................................................

.........................................................................................................................................

.........................................................................................................................................

.........................................................................................................................................

.........................................................................................................................................

....................................
දිනය

..........................................................
පාසල් ගොඩනැගිලි ඉංජිනේරු/
දිස්ත්‍රික් ඉංජිනේරු / ප්‍රාදේශීය ඉංජිනේරු
(නිල මුද්‍රාව)

## <u>IV කොටස: පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය</u>

ලේකම්,

අධ්‍යාපන අමාත්‍යාංශය

ඉහත සඳහන් ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම සම්බන්ධව පහත ලියවිලි මීට යා කර ඇත.

1. තත්ව වාර්තාව
2. ගොඩනැගිලි කඩා ඉවත් කිරීමේ වියදම් ඇස්තමේන්තුව
3. ගොඩනැගිලි ද්‍රව්‍යවල තක්සේරු වටිනාකම
4. පාසල් භූමියේ ගොඩනැගිල්ලේ පිහිටීම දැක්වෙන දළ පැලැස්ම

මෙම ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම මා විසින් නිර්දේශ කරමි / නොකරමි.

නිර්දේශ නොකරන්නේ නම් එයට හේතු :

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

......................................                                        ......................................

දිනය                                        පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ

(නිල මුද්‍රාව)

## <u>V කොටස: අධ්‍යාපන ලේකම්ගේ අනුමැතිය</u>

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,

.............................................

ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම අනුමත කරමි / නොකරමි.

......................................                                        ......................................

දිනය                                        ලේකම්

අධ්‍යාපන අමාත්‍යාංශය

(නිල මුද්‍රාව)